**<u>ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කළමනාකරණය කරනු ලබන හෝල් ඩි ගෝල් ශාලාව භාවිත කිරීමේ එකඟතා ගිවිසුම.</u>**

1. උත්සවය, රැස්වීම හෝ සංදර්ශනය පැවැත්වීමට නියමිත දිනට, දින හතකට (07) පෙර සම්පූර්ණ ගාස්තු ගෙවා අවසන් කිරීම සඳහා එකඟවෙමි.
2. මුදල් ගෙවා ශාලාව වෙන්කර ගත් පසු අවලංගු කර ගැනීමට කරන ඉල්ලීමක දී තැන්පත් කළ ඇප මුදල ආපසු නොගෙවන අතර, එය රජයේ ආදායමට බැර කරනු ලබනු බව දනිමි.
3. නියමිත වෙන්කර ගත් කාලයට පෙර හෝ පසුව ශාලාව භාවිත කරන්නේ නම් එම අතිරේක කාලයට නියමිත ගාස්තු ගෙවීමට එකඟවෙමි.
4. වෙන්කර ගත් භාණ්ඩ හා උපකරණ වලට අතිරේකව භාණ්ඩ හා උපකරණ භාවිත කළහොත් ඒ සඳහා නියමිත ගාස්තු ගෙවීමට කටයුතු කරමි.
5. සැරසිලි හා වේදිකා පසුතල නිර්මාණය කිරීමේ දී ශාලාවට, වේදිකාවට, බිත්තිවලට, හෝ තිර රෙදි ආදියට කිසිදු හානියක් නොවීමට තරයේ වගබලා ගනිමි. යම් හානියක් සිදුවුවහොත් එයට අදාළව තක්සේරු කරනු ලබන මුදල ගෙවීමට එකඟවෙමි.
6. ශාලා තුළ සැරසිලි සිදු කරන්නේ නම් ශාලාව භාර නිලධාරීගේ එකඟතාවය මත පමණක් සිදු කරමි. එම සවි කිරීම් වලදී ඇණ ගැසීම්, බිත්ති වලට හානි විය හැකි ඇලවීම් ආදියට ඉඩ නොදෙන බව දනිමි. වේදිකාවේ බිම , තිර රෙදි වල හෝ සිවිලිමෙහි කිසිඳු ඇලවීමක් , ඇණ හෝ කටු ගැසීමක් හෝ සිවිලිමෙහි සැරසිලි එල්ලීම සඳහා අවසර නොදෙන අතර අනවසරයෙන් එම කටයුතු සිදුකර ඇත්නම් තැන්පතු මුදල නැවත නොගෙවන අතර රජයේ ආදායමට බැර කරන බැවින් ශාලා භාර නිලධාරීගේ අනවසරයෙන් කිසිඳු කටයුත්තක් සිදු නොකිරීමට එකඟ වෙමි.
7. රිජිෆෝම්, තීන්ත, කඩදාසි, ශාක කොටස් ..... ආදිය භාවිත කරමින් වේදිකා සැරසිලි සකස් කිරීම ශාලාවෙන් බැහැරදී සිදුකළ යුතු අතර, එම සකස් කිරීම් ශාලාව තුළ දී සිදු කිරීමට ඉඩනොදෙන බව දනිමි.
8. වැඩසටහන් ආරම්භයේදී පොල්තෙල් පහන් දැල්වීමටත්, පූජා නර්තනයකදී පහන් භාවිතා කිරීමට පමණක් ඉඩ ලැබෙන බැවින් , ඒ හැර ප්‍රධාන ශාලාව තුළ කිසිඳු ගිණි දැල්වීමකට, ගිණිකෙළි භාවිතයට කුමන අයුරකින් හෝ සිදු නොකිරීමට එකඟ වෙමි. පොල්තෙල් පහන් දැල්වීමෙන් විනාඩි 15 කට පසු එයද ඉවත් කිරීමට එකඟවෙමි.
9. අදාළ වැඩසටහන් අවසන් වූ වහාම වේදිකා පසුතල, හා සැරසිලි සඳහා භාවිත කළ සියළුම ද්‍රව්‍ය සංවිධායකයින් විසින් ඉවත් කර ගන්නා අතර, නගර සභා සේවකයින් එම අපද්‍රව්‍ය භාර නොගන්නා බැවින් එම අපද්‍රව්‍ය පරිශ්‍රයෙන් සුදුසු පරිදි මා විසින් ඉවත් කර ගනිමි. නැතහොත් ඒවා ඉවත් කිරීම සඳහා දැරීමට සිදුවන අමතර පිරිවැය මා විසින් ගෙවීමට එකඟවෙමි.
10. ශාලාව ඉදිරිපිට කට්ටගල් ඇතිරූ සීමාවේ වැඩසටහන සඳහා පැමිණි වාහන නවතා නොතැබීමට මා වගබලා ගන්නා අතර, ආරක්ෂක නිලධාරීන්ට එම වාහන ඉවත් කරවීමට ද සහාය වෙමි.
11. නගර සභාව විසින් රැගෙන යන්නේ දිරන සහ නොදිරන වශයෙන් වෙන් කළ කසළ පමණක් බැවින්, ඒ පිළිබඳව වැඩසටහනට සහභාගි වන්නන් දැනුවත් කර ශාලාවෙන් පිටත තබා ඇති කසළ බඳුන් වලට කසළ වෙන්කර බැහැර කිරීමට කටයුතු කරමි. එසේ කටයුතු නොකිරීම හේතුවෙන් කසළ බැහැර කිරීම සඳහා අතිරේක පිරිවැයක් දැරීමට සිදුවුවහොත් එම පිරිවැයද මා විසින් ගෙවීමට එකඟවෙමි.
12. ප්‍රියසම්භාෂණ අවස්ථා වලදී ප්‍රධාන ශාලාවේ වේදිකාව කොටසේ මත්පැන්, දුම්වැටි, හා ආහාරපාන ලබාදීම සඳහා භාවිතා නොකරමි.
13. ශාලාව භාවිත කිරීමට අදාළ සියළු ගෙවීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත පමණක් ගෙවනු ලබන අතර, අදාළ මුදල් ගෙවූ කුවිතාන්සි, විෂය භාර නිලධාරී වෙත ඉදිරිපත් කිරීම එකඟවෙමි.
14. වැඩසටහන අවසානයේ දී ශාලාව භාවිත කළ කාලය හා භාවිත කළ උපකරණ ආදිය ඇතුලත් කර ශාලා භාර නිලධාරී ආකෘති පත්‍රයක් පිටපත් දෙකකින් සකස් කරන අතර, එය නිවැරදිව පරීක්ෂා

කර බලා සහතික කර අත්සන් තැබීමට එකඟවෙමි. ශාලා භාර නිලධාරී ද අත්සන් කළ පසු ඉන් එක් පිටපතක් ඉදිරි අවශ්‍යතා සඳහා මා භාරයේ තබාගනිමි.

15. තැන්පත් මුදල් ආපසු ගෙවීම චෙක්පතකින් පමණක් සිදුකිරීම හා එකඟවන අතර, අයදුම්කරු විසින් එම චෙක්පත ලිවිය යුතු නිවැරදි ආකාරය අයදුම්පතෙහි සටහන් කිරීම මාගේ වගකීමක් බව දනිමි.
16. ශාලාව හා අමතර පහසුකම් භාවිත කිරීමේ එම රජයේ දේපල වලට හානියක් සිදුවුවහොත් ඒවා සකස් කර දීම සඳහා තක්සේරු කරන ලබන අලාභය ගෙවීමට මා එකඟවෙමි.
17. පෙරවරුව සඳහා ශාලාව වෙන්කර ගත් අවස්ථාවල එදින පස්වරුව වෙනත් වැඩසටහනක් සඳහා වෙන්කර ඇත්නම් වෙන්කරගත් නියමිත වේලාව තුල වැඩසටහන් අනිවාර්යයෙන්ම අවසන් කළයුතු බව මා දන්නා අතර අමතර කාලයක් ලබා නොදෙන බව දනිමි.
18. ශාලාව වෙන් කිරීමෙන් පසුව වෙන් කිරීමට අදාළ වැඩසටහන පමණක් පවත්වන බවත් සභ්‍ය නොවන යැයි හැඟෙන කටයුතු සිදුවුවහොත් වැඩසටහන අවලංගු කරන බව දන්නා අතර නැවත ශාලාව ස්ථාන භාර නිලධාරී වෙත භාර දීමට ද එකඟ වෙමි.

ඉහත අංක 01 සිට 18 දක්වා කොන්දේසි කියවා අවබෝධ කරගත් බවත් ඒ අනුව ශාලා පහසුකම් භාවිත කිරීමට එකඟවන බවත් එකී කොන්දේසි කුමන ආකාරයකින් හා/හෝ උල්ලංඝනය වුවහොත් සිදුවිය හැකි මූල්‍යමය අලාභය මා විසින් ගාල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ගෙවීමට හා මාගේ අවශ්‍යතාවය වහාම අත්හිටුවීමට හා ශාලාව ස්ථාන භාර නිලධාරී වෙත වෙත ශාලාව නැවත භාර දීමට එකඟවන බවත් ඒ පිළිබඳ කිසිඳු විරෝධයක් පළ නොකරණ බවත් අත්සන් තබා මාගේ එකඟතාවය පළ කරමි.

ශාලාව වෙන් කර ගත් අයගේ අත්සන : ..............................................................

ශාලාව වෙන් කර ගත් අයගේ නම : ..............................................................

ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

දුරකතන අංකය : ............................................

දිනය : ............................................

ශාලාව භාර නිලධාරී අත්සන : ............................................